පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வடமத்திய மாகாணம
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
6

# තෙවන වාර පරීක්ෂණය- 2023

විෂයය : - **ගණිතය**

පාසලේ නම: ..............................................................................................

ඇතුළත්වීමේ අංකය: ................................................................................ කාලය :පැය 2 යි

## <u>I කොටස</u>

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**

(01) අගය සොයන්න.

$\frac{1}{2}+\frac{3}{10}$

(02) 5732004 යන සංඛ්‍යාව කලාප වලට වෙන්කර සංඛ්‍යා නාමය ද ලියන්න.

(03) පන්තියක ළමයින් ගණන ආසන්න 10 ගුණාකාරයට වැටයූ විට 40 ක් විය. පන්තියේ ළමයින් සංඛ්‍යාව සඳහා ගත හැකි අගයන් යටින් ඉරක් අඳින්න.

(1) 48 (2) 43 (3) 35 (4) 45

(04) අඹ ගෙඩි 4 ක මිල රු. 120 ක් වේ නම්, අඹ ගෙඩි 3 ක මිල සොයන්න.


(05) "අවුරුද්දට ඇති මාස ගණන" නියතයක් ද නැතහොත් විචල්‍යයක් ද යන්න ලියා දක්වන්න.

(06) 28 හි සාධක සියල්ල ලියන්න.

(07) 5025g ස්කන්ධය කිලෝග්‍රෑම් සහ ග්‍රෑම් වලින් දක්වන්න.

(08) “දෙකෙහි පස්වන බලය” දර්ශක අංකනයෙන් ලියා අගය සොයන්න.

(09) පහත දී ඇති කොටු දැල මත වර්ගඵලය වර්ග ඒකක 12 ක් වන තල රූපයක් පාට කර පෙන්වන්න.
(එක් කුඩා කොටුවක වර්ගඵලය වර්ග ඒකක 1 ක් ලෙස ගන්න.)



(10) සවිධි චතුස්තලයට දාර කීයක් තිබේද?

(11) 7 m 25 cm යන්න මීටර වලින් ලියා දක්වන්න.

(12) පළමු සමචතුරස්‍ර සංඛ්‍යා තුන ලියා, ඒවායේ එකතුව සොයන්න.


(13) 2.28 - 1.9 අගය සොයන්න.

(14) සංවෘත සරල රේඛීය තල රූපයක් ඇඳ පෙන්වන්න.


**NCP/G06/2023/3rd/32S**

(15) ඍජුකෝණාස්‍රයක දිග 10 cm ද පළල 5 cm ද වේ. ඍජුකෝණාස්‍රයේ දිග හා පළල අතර අනුපාතය සරල ම ආකාරයට ලියන්න.

(16) නිවසේ සිට රෝහලට ඇති කෙටිම දුර කුමන දිශාවක් ඔස්සේ වැටී තිබේද?




(17) පහත රූපයේ 1, 2 ලෙස නම් කර ඇති කෝණ වල කෝණ නාමය ලියා දක්වන්න.




1 ---------------------------------

2 ---------------------------------

(18) 1980 ÷ 15 අගය සොයන්න.

(19) ප. ව. 7.30 අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

(20) (-5) ට වඩා කුඩා සංඛ්‍යා 2ක් ලියන්න.

**NCP/G06/2023/3rd/32S**

## ☞☞ කොටස

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු ලියන්න.**
- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**
- **(පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.)**

(01)

(a) පාසලේ සිසුන් 20 දෙනෙකුගේ නිවෙස්වල තිබෙන ජංගම දුරකථන සංඛ්‍යාව පහත ආකාරයට සටහන් කරගෙන තිබුණි.

**2 , 3 , 4 , 3 , 2 , 2 , 5 , 1 , 4 , 3 , 5 , 4 , 1 , 4 , 3 ,4 , 1 , 4 ,3 , 1**

| ජංගම දුරකථන සංඛ්‍යාව | ප්‍රගණන ලකුණු | නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| දුරකථන 1 බැගින් | //// | **04** |
| දුරකථන 2 බැගින් | | |
| දුරකථන 3 බැගින් | | |
| දුරකථන 4 බැගින් | | |
| දුරකථන 5 බැගින් | | |

I. වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 4)

II. වැඩිම නිවාස ප්‍රමාණයකින් වාර්තා වූ ජංගම දුරකථන ගණන කීයද? (ලකුණු 2)

III. "◯" සලකුණකින් නිවාස 2ක් නිරූපණය කරමින් ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්ථාරයකින් නිරූපණය කරන්න. (ලකුණු 5)

| | |
|---|---|
| දුරකථන 1 බැගින් | |
| දුරකථන 2 බැගින් | |
| දුරකථන 3 බැගින් | |
| දුරකථන 4 බැගින් | |
| දුරකථන 5 බැගින් | |

(b)

I. 5 හි දෙවන බලය කීයද? (ලකුණු 1)

II. $4^3$ හි අගය කීයද? (ලකුණු 1)

III. 32, දෙකෙහි බලයක් ලෙස ලියන්න. (ලකුණු 1)

IV. $3^5$ හි පාදය හා දර්ශකය කුමක්ද? (ලකුණු 2)

(02) (a) අගය සොයන්න.

(i)

| kg | g |
|---|---|
| 2 | 750 |
| + 3 | 380 |
| | |

(ii)

| kg | g |
|---|---|
| 2 | 250 |
| − 1 | 750 |
| | |

(ලකුණු 4)

(iii) 2 kg 10 g , ග්‍රෑම් වලින් ලියන්න. (ලකුණු 2)

(b) මාස 5කදී නිවසකට ගෙනෙන ලද සීනි ප්‍රමාණ පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| මාසය | සීනි ස්කන්ධය |
|---|---|
| ජනවාරි | 2 kg 500 g |
| පෙබරවාරි | 3 kg 250 g |
| මාර්තු | 3 kg 750 g |
| අප්‍රේල් | 6 kg 500 g |
| මැයි | 4 kg |

I. වැඩිම සීනි ප්‍රමාණයක් ගෙනෙනෙ ලද්දේ කවර මාසයේද? (ලකුණු 1)

II. මාර්තු මාසයට වාඩා අප්‍රේල් මාසයේ වැඩිපුර ගෙනෙන ලද සීනි ප්‍රමාණය කොපමණද? (ලකුණු 2)

III. ජනවාරි සහ පෙබරවාරි නිවසට ගෙනෙන ලද මුළු සීනි ප්‍රමාණයටත් වඩා අප්‍රේල් මාසයේදී ගෙනෙන ලද සීනි ප්‍රමාණය වැඩි වූ බව අම්මා පවසයි.මෙම ප්‍රකාශය සත්‍ය වන බව පෙන්වන්න.

(ලකුණු 2)

(03) (a)

I. බෑගයක පොත් 20ක් තිබුණි. ඉන් පොත් p ප්‍රමාණයක් ඉවත් කරන ලදී. බෑගයේ ඉතිරි පොත් ප්‍රමාණය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ලකුණු 2)

II. p = 8 නම් ඉතිරි පොත් ප්‍රමාණය සොයන්න. (ලකුණු 2)

III. ඉහත (11) හිදී ඉතිරි වූ පොත් ප්‍රමාණයට නැවත පොත් n ප්‍රමාණයක් එකතු කරන ලදී. දැන් බෑගයේ ඇති පොත් ප්‍රමාණය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ලකුණු 2)

(b)

I. බෝලයක මිල රු. $a$ වේ. බෝලයක මිල රු 30කින් ඉහළ ගිය විට බෝලයක නව මිල රු. $a$ ඇසුරින් සොයන්න. (ලකුණු 3)

II. $a$ = 80 නම් බෝලයේ නව මිල සොයන්න. (ලකුණු 2)

(04) (a)

I. 3 : 5 යන අනුපාතය කියවන ආකාරය ලියන්න. (ලකුණු 1)

II. 3 : 5 අනුපාතයට තුල්‍ය අනුපාත 2ක් ලියන්න. (ලකුණු 2)

III. පහත දැක්වෙන එක් එක් අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න. (ලකුණු 2)

1. 20 : 25
2. 64 : 40

IV. මල්ලී ළඟ රිබන් 1m ක් ද මා ළඟ 20 cm ක් දිග රිබන් කැබැල්ලක් ද තිබුණි. මල්ලී ළඟත් මා ළඟත් තිබූ රිබන් ප්‍රමාණ අතර අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න. (ලකුණු 3)


(b)

I. වාහනයක ඉන්ධන 1 $l$ කින් 15km ක දුරක් ගමන් කරයි නම් 90km ක දුරක් යාමට ඉන්ධන ලීටර කීයක් අවශ්‍යද? (ලකුණු 2)


II. ඇමරිකන් ඩොලර් 1 ක මිල රු. 320 ක් වූ දිනක ඇමරිකන් ඩොලර් 5ක මිල සොයන්න. (ලකුණු 1)

(05) (a)

I. පහත ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න. (ලකුණු 2)




II. එක් කුඩා කොටුවක වර්ගඵලය 1 $cm^2$ ලෙස ගෙන, පහත කොටු ජාලය මත අඳුරු කර ඇති රූපයේ වර්ගඵලය සොයන්න. (ලකුණු 2)



III. සෘජුකෝණාස්‍රයක දිග 12 ක් ද පරිමිතිය 34 ක්ද වේ නම් එහි පළල සොයන්න. (ලකුණු 2)

(b)

I. $2\,l$ $50\,ml$, මිලිලීටර වලින් දක්වන්න. (ලකුණු 1)

II. කුඩා බෝතලයකට පළතුරු යුෂ 80 $ml$ ක් පිරවිය හැකි වේ. එවැනි බෝතල් 25ක ඇති පළතුරු යුෂ ප්‍රමාණය නිමානය කරන්න. (ලකුණු 2)

III. පළතුරු යුෂ 850 $ml$ කට ජලය $4l$ $700\,ml$ එකතු කර සෑදිය හැකි බීම ප්‍රමාණය ලීටර හා මිලිලීටර වලින් දක්වන්න. (ලකුණු 2)

(06) (a)

I. $\frac{8}{10}$ භාගය සඳහා තුල්‍ය භාග 2ක් ලියන්න. (ලකුණු 2)

II. $\frac{6}{10}$ සහ $\frac{30}{50}$ යන භාග තුල්‍ය භාග වේ දැයි සොයන්න. (ලකුණු 2)

III. අගය සොයන්න.

1. $\frac{2}{5}+\frac{5}{20}$ (ලකුණු 2)

2. $\frac{2}{3}-\frac{5}{12}$ (ලකුණු 2)

(b)

(i) පහත දශම අවරෝහණ පටිපාටියට සකසන්න. (ලකුණු 1)

0.2 , 0.02 , 0.22

(ii) 2.2 - 0.25 අගය සොයන්න. (ලකුණු 2)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# Third Term Test - 2023

Grade: 6

Subject :- ..............................................................

School Name : ..........................................................................................

Index Number : ............................ Time :

## තෙවන වාර පරීක්ෂණය 2023

## 6 ශ්‍රේණිය ගණිතය - පිළිතුරු පත්‍රය

### 1 කොටස

(01) $\frac{8}{10} = \frac{4}{5}$

(02) 5 732 004 පස් මිලියන හත්සිය දෙදහස් හතරයි.

(03) (2) 43 (3) 35

(04) රු: 90

(05) නියතයක්

(06) 1,2, 4, 7, 14, 28

(07) 5 kg 25 g

(08) $2^5$

(09) සුදුසු රූපයකට

(10) 6

(11) 7.25m

(12) 1, 4 , 9 1 + 4 + 9 = 14

(13) 0.38

(14) සුදුසු රූපයකට

(15) 2:1

(16) ගිණිකොණ

(17) 1- සුළු කෝණය, 2- පරාවර්ථ කෝණය

(18) 132

(19) 19:30

(20) සුදුසු පිළිතුරු දෙකකට (සියළු පිළිතුරු සඳහා ලකුණු 2 බැගින් ලකුණු 40ක් හිමිවේ)

# 2 කොටස






(01) (a) (i)

| | | |
|---|---|---|
| 2 බැගින් | /// | 3 |
| 3 බැගින් | ~~////~~ | 5 |
| 4 බැගින් | ~~////~~ / | 6 |
| 5 බැගින් | // | 2 |

(ලකුණු 4)

(ii) 4 (ලකුණු 2)

(iii) (ලකුණු 5)

| | |
|---|---|
| 1 බැගින් |  |
| 2 බැගින් |  |
| 3 බැගින් |  |
| 4 බැගින් |  |
| 5 බැගින් |  |

(b)

I. 5 x 5 =25 (ලකුණු 1)

II. 4 x 4 x 4 = 64 (ලකුණු 1)

III. $2^5$ (ලකුණු 1)

IV. පාදය -3 දර්ශකය -5 (ලකුණු 2)

(02) (a) (i) 6kg 130g (ii) 500 g (iii) 2010 g (ලකුණු 2 x 3 )

(b)

I. අප්‍රේල් (ලකුණු 1)

II. 2kg 750g (ලකුණු 2)

III. 5kg 750g (ලකුණු 2)

5kg 750g > 6kg 500g ප්‍රකාශය සත්‍ය වේ

(03) (a)

I. 20 - p (ලකුණු 2)

II. 20 – 8 = 12 (ලකුණු 2)

III. 12 + n (ලකුණු 2)

(b)

I. a + 30 (ලකුණු 3)

II. රු: 110 (ලකුණු 2)

(04) (a)

I. තුන අනු පහ (ලකුණු 1)

II. සුදුසු නිවැරදි පිළිතුරු දෙකකට (ලකුණු 2)

III. 4:5

8:5 (ලකුණු 2)

IV. 100 : 20 = 5 : 1 (ලකුණු 3)

(b)

i. 6*l* (ලකුණු 2)

ii. රු: 1600 (ලකුණු 1)

(05) (a)

i. 22 cm 1mm (ලකුණු 2)

ii. 16 $cm^2$ (ලකුණු 2)

iii. 5 cm (ලකුණු 2)

(b)

i. 2050m*l* (ලකුණු 1)

ii. 2000m*l* = 2*l* (ලකුණු 2)

iii. 5 *l* 550 m*l* (ලකුණු 2)

(06) (a)

i. සුදුසු නිවැරදි පිළිතුරු දෙකකට (ලකුණු 2)

ii. $\frac{6\times5}{10\times5} = \frac{30}{50}$ තුල්‍ය භාගයක් වේ (ලකුණු 2)

iii. 1 $\frac{13}{20}$ (ලකුණු 2)

2 $\frac{3}{12}$ (ලකුණු 2)

(b)

i. 0.22 , 0.2 , 0.02 (ලකුණු 1)

ii. 1.95 (ලකුණු 2)